## 1.1 හැඳින්වීම

සාහිත්‍ය සහ මානව ජීවිතය අතර පවතින්නේ අවියෝජනීය වූ ත් , අපූර්ව වූ ත්, සබඳතාවයකි. සාහිත්‍ය වනාහි මානවයා විසින් සාක්ෂාත් කරගනු ලැබූ උත්තරීතර හා විශිෂ්ටතම හැඟීම් අන් අය වෙත සම්ප්‍රේෂණය කිරීම අරමුණු කරගත් මානව සන්නිවේදන ක්‍රියාවලියක් ලෙස හඳුනා ගත හැකි ය. මානව සංහතියේ ප්‍රාරම්භක යුගයේ පටන් සන්නිවේදන මාධ්‍යයක් ලෙස විවිධ සාහිත්‍යාංගයන් මානවයා උපයෝගීකරගත් අතර එම සාහිත්‍යාංග මගින් මානව සත්තාවේ පවතින සාරධර්ම , චර්යා පද්ධති , සිතුම් - පැතුම් , සංස්කෘතික අංග , සම්ප්‍රදායන් ආදී මානව ජීවිතය හා බැඳි සංරචකයන් පිළිබිඹු කරමින් මානවයා සමාජය සමඟ බද්ධ කරන බව පෙනේ. මේ බව වඩාත් ම සාධනීය ලෙස දැක්විය හැක්කේ පුරාතන ග්‍රීක සාහිත්‍ය පිළිබඳව විමසන කල්හි ය.

" සාහිත්‍ය යනු මිනිස් ජීවිතය සමග අත්‍යන්තයෙන් බැඳුණු එකක් බව පෙනේ . එ මෙන් ම එය ජන සමාජයක යහපත් පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වූ දෙයක් බව ද හෙළි වේ. මිනිසාගේ සිතේ බාහිර හා අධ්‍යාත්මික පැතිවල සැනසීම ත් සාහිත්‍යයෙන් ඇති කරන බව ප්ලේටෝ කියයි. මිනිසාට මානව දයාව , යහගුණ ධර්ම , සාරධර්ම , පෞද්ගලික හා පොදු චර්යාවන් තේරුම් ගැනීමට ත් සාහිත්‍ය ඉතා අත්‍යවශ්‍ය ය. මනුෂ්‍යත්වයේ ඇති සැබෑ දුබලකම් හා ප්‍රබලකම් වටහාගත හැක්කේ ත් , ඒ අනුව සමාජය හා සදාතනික බැම්මකින් බැඳිය හැක්කේ ත් සාහිත්‍ය තුළිණි. " [1]( වීරරත්න , 2005 , පෙරවදන )

ගද්‍ය , පද්‍ය , දෘශ්‍ය කාව්‍ය ආදී සාහිත්‍යාංගවලින් මෙන් ම දර්ශනය , දේශපාලනය , විද්‍යාව, අධ්‍යාපනය ආදී නේක ක්ෂේත්‍රයන් පිළිබඳව රචිත සාහිත්‍යාංගවලින් ද අත්‍යන්තයෙන් සුපෝෂිත පුරාතන ග්‍රීක සාහිත්‍ය ප්‍රෞඪ වූ ද , පෘථුල වූ ද , මිහිතලය පුරා ව්‍යාප්ත වූ සාහිත්‍යයක් බව කිවමනා නොවේ. වෙසෙසින් ම පුරාතන ග්‍රීක සාහිත්‍යයෙහි කැපී පෙනෙන ලක්ෂණය වන්නේ ඔවුන්ගේ සාහිත්‍යාංග තුළින් මානව දිවිය පිළිබඳ තතු තත්ත්වාකාරයෙන් හා ගැඹුරින් සංස්පර්ශය කරන , ජීවිතය පිළිබඳ අත්දැකීම් පදනම් කරගත් තීක්ෂණ බුද්ධියක් විශද කරන, පරමාදර්ශී ජීවිත අතිශෝක්තියට නඟා කියවන , සමාජයේ නොමනාකම් මේ යැයි විදහා දක්වන , අදෘශ්‍යමාන වටහා ගත නොහැකි ප්‍රපංචයන් ගැන කතා කරන , මානව සබඳතා තහවුරු කරන සාරධර්ම එනම් පතිවත , පත්නීවත , වීරත්වය , ධෛර්යය , අධිෂ්ඨානය , සාධාරණත්වය , කරුණාව , දයාව ආදිය පිළිබඳව ශබ්ද , අර්ථ , අලංකාරයෙන් අනූනව , ඉතා පැහැදිලිව මානව සමාජයට සන්නිවේදනය කිරීම ය.

අතීත ග්‍රීක සමාජය මැනවින් සකස්වීමේ කාර්යයෙහි ලා මෙම සාහිත්‍යාංග මහත් වූ පිටුවහලක් සපයන්නට ඇතැ යි නිගමනය කළ හැකි ය. මන්ද මෙම සාහිත්‍යාංගයන් මානව හැඟීම් සමඟ ඉතාමත් සමීප ගනුදෙනුවක යෙදෙමින් සාරධර්ම වහනය කරමින් මානවයාගේ සදාචාරය සුසංවර්ධනය කරන බැවිණි.

එහි ලා දෘශ්‍ය කාව්‍ය ප්‍රධාන භූමිකාවක නිරතවන්නට ඇතැ යි සාධනය කළ හැක්කේ එම දෘශ්‍ය කාව්‍ය කෘතී රාශියක් ම සියුම් මානුෂීය හැඟීම් පිළිබිඹු කරන, මනුෂ්‍ය අධ්‍යාත්මයේ සාර්වත්‍රික සත්‍යතා ත් , මානවයාගේ හෘද අභ්‍යන්තරයේ සංවේදනා පිරිමදින නිසාත් ය. එහි දී ග්‍රීක දෘශ්‍යකාව්‍යකරුවා , ප්‍රේක්ෂකයා සමඟ හෘද සංවාදයේ යෙදෙමින් චිත්ත අභ්‍යන්තරය සංස්පර්ශකොට සාරධර්ම අධ්‍යාත්මයට වහනය කරනු ලැබේ.

පුරාතන ග්‍රීක සාහිත්‍ය හා දාර්ශනික සංකල්ප පිළිබඳව පර්යේෂණ සිදුකිරීම වැදගත් වන්නේ චිරන්තන විශ්ව සාහිත්‍ය සම්ප්‍රදාය ගුරුකොට ගැනුණු ඇතැම් සෛද්ධාන්ත බොහෝ විට පුරාතන ග්‍රීක සාහිත්‍යයේ ආභාසය හා සෙවනැල්ල මත සකස් වූ ඒවා වීම නිසා ය.

සන්නිදර්ශකයක් ලෙස ග්‍රීසියෙහි දර්ශනය පහළ වීමට පූර්වයෙන් මානව චින්තනයන් ප්‍රධාන වශයෙන් ජනශ්‍රැති සහ මිථ්‍යා ප්‍රබන්ධවලින් නිර්මාණය වූ බවට නිගමනය කළ හැකි ය . එහි දී දාර්ශනිකයින් විසින් මිථ්‍යා අදහස්වලින් බැහැරව බුද්ධිමය සංවාද කරා අවතීර්ණ වීම සුවිශේෂී සංධිස්ථානයකි. " ග්‍රීක චින්තාව ඥාන සාගරයකි. එය මහඟු දාර්ශනික චින්තා නැමැති මාණික්‍යයෙන් පිරි භාණ්ඩාගාරයක් වැන්න. ඇත්ත වශයෙන් කියතොත් දර්ශන ලෝකයට අයත් මූලික සංකල්ප සියල්ල ම පාහේ ග්‍රීක චින්තාව තුළ නිලීනව ඇතැ යි පැවසීම නිවැරැදි යැයි හඟිමු ." [2]( ඥානාරාම හිමි පාතේගම , සමරකෝන් , 1981 , පිටුව ix )

රාජ්‍ය , රාජ්‍ය පාලන නීති පිළිබඳව අදහස් පහළ කළ තෝතැන්න වූයේ ද පුරාණ ග්‍රීසියයි . " නූතන දේශපාලන චින්තකයින්ට විෂය වූ යුක්තිය , නිදහස , ව්‍යවස්ථානුකූල ආණ්ඩුව , නීතියට ගරු කිරීම වැනි දේවල් සම්බන්ධයෙන් අර්ථ නිරූපණය කිරීම් ග්‍රීක රාජ්‍ය තුළින් ආරම්භ වි ය." [3]( අතුකෝරල , 2006 , පිටුව 1 )